# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1892/43 - 2014 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**පුත්තලම නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන පුත්තලම නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 65අ(2) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි එම්. ඒ. ආර්. අලිසබ්රි නම් වූ සභිකයා අයත් වන ස්වාධීන කණ්ඩායම් අංක 8 හි නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත පුත්තලම නගර සභාවේ සභිකයකු වශයෙන් පත් කිරීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන වාසල මුදියන්සේලාගේ සෙනවිරත්න වාසල බංඩාර මහතා ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පුත්තලම නගර සභාවේ තේරීම් භාර නිලධාරී පාක්‍යරාජා රගුනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2)(ආ) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වාසල මුදියන්සේලාගේ සෙනවිරත්න වාසල බංඩාර මහතා පුත්තලම නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පාක්‍යරාජා රගුනාදන්,
තේරීම් භාර නිලධාරී,
පුත්තලම නගර සභාව.

2014 දෙසැම්බර් මස 09 වන දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

12 - 980


1A - G 20747 — 20 (2014/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*